# අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

## වෘත්තීය අධ්‍යාපන අංශය

# ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

# පුරප්පාඩු

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, වෘත්තීය අධ්‍යාපන අංශය යටතේ පවතින ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා ස්ථිර පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.**

### 01. නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු - විභාග - (MM 1-1) - තනතුරු 01

**සුදුසුකම් -**

**බාහිර -**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් මෝටර් කාර්මික / යාන්ත්‍රික/ විදුලි ඉංජිනේරු උපාධියක් ලබා තිබීම සහ උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

(ආ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර -**

(අ) බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

**හෝ**

(ආ) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක කනිෂ්ඨ කළමනාකරණ (JM) සේවා ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය** - කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/ 2025 අනුව,
MM 1-1 - රු. 91,690 - 2,480X10- 3,450X15-168,240/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි.)

**බඳවා ගැනීමේ ක්‍රමය** - තරඟකාරී ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව** -

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 25 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### 02. අභ්‍යාස ඉංජිනේරු - (JM 1-1) - තනතුරු 14

**සුදුසුකම් -**

**බාහිර -**

(අ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

**හෝ**

(ආ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

**සහ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

(ඇ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පස් (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

**සහ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර -**

(අ) බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

**හෝ**

(ආ) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක කළමනාකරණ සහකාර - තාක්ෂණ (MA 2-2) සේවා ගණයෙහි II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය** - කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව,
JM 1-1 - රු. 72,650 - 1,360X10-2,040X18-122,970/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි.)

**බඳවා ගැනීමේ ක්‍රමය** - තරඟකාරී ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### 03. වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරී - (JM 1-1) - තනතුරු 01

**සුදුසුකම් -**

**බාහිර -**

(අ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම

**හෝ**

(ආ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

**සහ**

සුදුසුකම් ලබාගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

(ඇ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පස් (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

**සහ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර -**

(අ) බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

**හෝ**

(ආ) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක කළමනාකරණ සහකාර - තාක්ෂණ (MA 2-2) සේවා ගණයෙහි II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය** - කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව,
JM 1-1 - රු. 72,650 - 1,360X10-2,040X18-122,970/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි.)

**බඳවා ගැනීමේ ක්‍රමය** - තරඟකාරී ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### 04. ගිණුම් නිලධාරී - (JM 1-1) - තනතුරු 01

**සුදුසුකම් :-**

**බාහිර-**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක මූල්‍ය කළමනාකරණ, ගණකාධිකරණ, ව්‍යාපාර පරිපාලන හෝ වාණිජ උපාධියක් ලබාතිබීම.

**හෝ**

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර 01 ක පළපුරුද්දක් ලබා තිබීම සමග පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක මධ්‍ය පරීක්ෂණය සමත් වීම.

**අභ්‍යන්තර -**

(අ) බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

**හෝ**

(ආ) කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1-2) සේවා ගණයෙහි II ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය** - කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව,
JM 1-1 - රු. 72,650 - 1,360X10-2,040X18-122,970/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි.)

**බඳවා ගැනීමේ ක්‍රමය** - තරඟකාරී ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### 05. පුස්තකාලයාධිපති - (JM 1-1) - තනතුරු 01

**සුදුසුකම් :-**

**බාහිර-**

(අ) පුස්තකාල විද්‍යාව පිළිබඳ උපාධියක් ලබාතිබීම සමග රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අවම වශයෙන් වසර එක (01) ක පුස්තකාලයාධිපති වශයෙන් පළපුරුද්දක් ලබා තිබීම

**හෝ**

(ආ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අවසාන විභාගය සමත් වීම සමග රාජ්‍ය දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක වසර තුන (03) ක පුස්තකාලයාධිපති වශයෙන් පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර -**

(අ) බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

**හෝ**

(ආ) කළමනාකරණ සහකාර - තාක්ෂණ නොවන (MA 1-2) සේවා ගණයෙහි II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය** - කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව,
JM 1-1 - රු. 72,650 - 1,360X10-2,040X18-122,970/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි.)

**බඳවා ගැනීමේ ක්‍රමය** - තරඟකාරී ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### 06. ආරක්ෂක නිලධාරී - (JM 1-1) - තනතුරු 01 - අභ්‍යන්තර අයදුම්පත් කැඳවීමක් පමණි

**සුදුසුකම් :-**

**අභ්‍යන්තර -**

"කළමනාකරණ සහකාර" සේවා ගණයෙහි II ශ්‍රේණියේ ආරක්ෂක පරීක්ෂක තනතුරෙහි අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය** - කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව,
JM 1-1 - රු. 72,650 - 1,360X10-2,040X18-122,970/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි.)

**බඳවා ගැනීමේ ක්‍රමය** - තරඟකාරී ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### 07. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - (MA 1-2)

**ලං.ජ.කා.අ.ආයතනීය ආණමඩුව කලාපීය මධ්‍යස්ථානය - තනතුරු 02**

**ලං.ජ.කා.අ.ආයතනීය බොරැල්ල කලාපීය මධ්‍යස්ථානය - තනතුරු 01**

**සුදුසුකම් :-**

**බාහිර -**

(අ) අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් පැරණි නිර්දේශය යටතේ විෂයයන් හතරකින් හෝ නව නිර්දේශය යටතේ විෂයයන් තුනකින් සමත්වීම.

**සහ**

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් සමත්වීම.

**අභ්‍යන්තර -**

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් සමත් වී දැනට ප්‍රාථමික - ශිල්පීය නොවන (PL1) - හා ප්‍රාථමික - ශිල්පීය (PL3) - වැටුප් කාණ්ඩයේ අයට මේ සඳහා අයදුම් කළ හැකිය.

**වැටුප් පරිමාණය** - කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව,
MA 1-2 - රු. 46,220 - 540X10-630X07-1,080X12-1,280X12-84,350/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි.)

**බඳවා ගැනීමේ ක්‍රමය** - තරඟකාරී ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### 08. රියැදුරු - (PL-3) - තනතුරු 04

**සුදුසුකම් :-**

**බාහිර -**

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් විෂයයන් 02 කින් සමත්වීම සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන බර වාහන පැදවීමේ වලංගු රියැදුරු බලපත්‍රයක් ලබාගැනීමෙන් පසු රියපැදවීම පිළිබඳ වසර 03 ක අවම පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර -**

මෝටර් රථ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන බර වාහන රියැදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීම පිළිබඳ වසර 03 ක පළපුරුද්දක් සහ ප්‍රාථමික - ශිල්පීය නොවන (PL1) වැටුප් කාණ්ඩයේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර සිටින අයට මේ සඳහා අයදුම් කළ හැකිය.

**වැටුප් පරිමාණය** - කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව,
PL3 - රු. 43,280 - 490X10-540X10-590X10-630X12 - 67,040/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි.)

**බඳවා ගැනීමේ ක්‍රමය** - වෘත්තීය පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### 09. කාර්යාල කාර්ය සහායක - (PL-1)

**ලං.ජ.කා.අ.ආයතනීය බොරැල්ල කලාපීය මධ්‍යස්ථානය - තනතුරු 01**

**සුදුසුකම් - අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම**

**වැටුප් පරිමාණය** - කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව,
PL1 - රු. 40,500 - 450X10-490X10-540X07-590X15-62,530/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි.)

**බඳවා ගැනීමේ ක්‍රමය** - වෘත්තීය පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**සියලුම තනතුරු සඳහා අදාළ පොදු කොන්දේසි :**

- සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- මානසික හා කායික වශයෙන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට සුදුසු විය යුතුය.
- ඉතා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
- ඉහත තනතුරුවලට බඳවා ගන්නා බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයක් සැපිරිය යුතුය. ඔහු/ඇය එම කාලසීමාව අවසානයේ දී පෙන්වනු ලබන සතුටුදායක කාර්ය සාධනය සහ පැවැත්ම අනුව, තනතුරෙහි ස්ථිර කරනු ඇත. දැනටමත් තනතුරෙහි ස්ථිර කර ඇති අභ්‍යන්තර අයදුම්කරුවන් වසර 01 ක වැඩ බලන කාලසීමාවකට යටත් වනු ඇත.
- ඉහත තනතුරුවලට බඳවා ගැනීම් අදාළ තනතුරෙහි ආරම්භක වැටුප් පියවරට වේ.
- සේවක අර්ථසාධක අරමුදල සඳහා වැටුපෙන් 08% ක් අයකර ගනු ලබන අතර, ඊට ආයතනයේ දායකත්වය 12% ක් හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල සඳහා 3% ක් වේ.

**අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල ඡායා පිටපත් ස්වකීය අයදුම්පත සමග අමුණා එවිය යුතුය.**

**(අ) උප්පැන්න සහතිකය**
**(ආ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහාවූ සහතික**
**(ඇ) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික**
**(ඈ) ජාතික හැඳුනුම්පත**

දැනට රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ දෙපාර්තමේන්තුවල සේවය කරන අය තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් එවිය යුතු අතර, අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි බවට ආයතන ප්‍රධානියා සහතික කළ යුතුය. ඥාතින් නොවන ඔබ පිළිබඳව විමසිය හැකි දෙදෙනෙකු ඇතුළත්ව සම්පූර්ණ විස්තර සහිත අයදුම්පතක් තමා විසින් සහතික කරන ලද සහතිකවල පිටපත් සමඟ **2025.11.02** දිනට ප්‍රථම **කළමනාකාර - පරිපාලන හා මානව සම්පත්, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය, අංක 582, ගාලු පාර, ගල්කිස්ස** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරන තනතුර නිවැරදිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

බඳවා ගැනීමට කිසිදු ආකාරයකින් බලපෑමක් කිරීම බඳවා ගැනීමට නුසුදුසුකමක් වනු ඇත.

**අධ්‍යක්ෂ - විදුහල්පති**
**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය,**
**අංක 582, ගාලු පාර,**
**ගල්කිස්ස.**